www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 44 S

නම ..............................................  නැටුම් I කොටස  කාලය පැය දෙකයි

උපදෙස් : සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
  1 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දහවන පා සරඹයේසරඹ නාමය
   1. දැල අඩිය වේ.   2. සිව් අඩිය වේ.
   3. තුන්පැති අඩිය වේ.   4. චක්‍ර අඩිය වේ.

02. අර්ධ චක්‍ර සරඹය යනුවෙන් හඳුන්වනු ලබන්නේ
   1. නව වන ගොඩ සරඹයයි.   2. අට වන ගොඩ සරඹයයි.
   3. හත් වන ගොඩ සරඹයයි.   4. හය වන ගොඩ සරඹයයි.

03. මැදුම් තනි තිතට අයත් වන්නමක් වන්නේ
   1. සිංහ රාජ වන්නම ය.   2. නෛයියඩි වන්නම ය.
   3. හනුමා වන්නම ය.   4. වෛරොඩි වන්නම ය.

04. කඩතුරා කවි ගායනා කරනු ලබන්නේ
   1. ශාන්ති කර්ම වලදී ය.   2. වන්නම් වලදී ය.
   3. ගැමි නැටුම් වලදී ය.   4. ගැටි නාටක වලදී ය.

05. ශාන්ති කර්ම වලදී පොදු චාරිත්‍ර විධියක් නොවන්නේ,
   1. කප් සිටුවීම   2. මඩු පේ කිරීම   3. තොට පේ කිරීම   4. මිල්ල කැපීම.

06. ගැට බෙරයේ දකුණු ඇස ආරක්ෂාවට යොදා ගනු ලබන්නේ,
   1. සුරත් තට්ටුවය.   2. හැක්ම ය.   3. වෙනිවර කැරැල්ලය   4. කැපුම් හමය

07. "දී කිරි දී කිරි ගෙනාවා දී කිරි " ගීතය සඳහා සංගීත නිර්මාණය කරන ලද්දේ
   1. ලූෂන් බුලත්සිංහල මහතා විසිනි.   2. ඔස්ටින් මුණසිංහ මහතා විසිනි.
   3. අනුලා බුලත්සිංහල මිය විසිනි.   4. ආනන්ද සමරකෝන් මහතා විසිනි.

08. සරල සැරසිලි අංගයක් නොවන්නේ,
   1. ගොප් ගෙඩිය   2. නෙළුම් මල   3. සරල පියුම   4. ගොප්කොළ නළාව

09. සතර දේවාල මඟින් පමණක් නැටුම් ගැයුම් වැයුම් සහිතව දින පහක් පුරා පැවැත්වෙන අලංකාර පෙරහැරකි.
   1. කුඹල් පෙරහැර   2. රන්දෝලි පෙරහැර
   3. වීථි පෙරහැර   4. කතරගම පෙරහැර

10. උඩරට වන්නම් රචනා වී ඇත්තේ
   1. කොළඹ යුගයේ දී ය.   2. මහනුවර යුගයේ දී ය.
   3. ගම්පළ යුගයේ දීය.   4. කුරුණෑගල යුගයේදී ය.

11. දේශීය නර්තන සම්ප්‍රදායන් තුනටම පොදු වූ ශාන්ති කර්මයක් වන්නේ
   1. කොහොඹා කංකාරි ශාන්ති කර්මය යි.   2. දෙවොල් මඩු ශාන්ති කර්මය යි.
   3. බලි ශාන්ති කර්මය යි.   4. පහන් මඩු ශාන්ති කර්මය යි



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

12. කුඹල්කරුවෙකුගේ චරිතය තුළ ඇති සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,
   1. දෑල් ඇදීමය.   2. මැටි පදම් කිරීමය .   3. දළු නෙලීමය.   4. අස්වනු නෙලීමය.

13. සිංහරාජ වන්නමේ තාල රූපය
   1. මාත්‍රා 2+2 වේ.   2. මාත්‍රා 4+ 4 වේ.   3. මාත්‍රා 3 +3 වේ.   4. මාත්‍රා 2+ 3 වේ.

14. තාන්ජාවූර් සහෝදරයින්ගේ මැදිහත් වීමෙනිසා ප්‍රවර්ධනය වූ දකුණු ඉන්දීය නර්තන සම්ප්‍රදාය වන්නේ,
   1. භරත නර්තන සම්ප්‍රදායයි.   2. කථකලි නර්තන සම්ප්‍රදායයි.
   3. මණිපුරි නර්තන සම්ප්‍රදායයි.   4. කථක් නර්තන සම්ප්‍රදායයි.

15. 1 2̂ / 1 2́ 3 යනු
   1. තනි තිතේ තාල රූපයකි.   2. දෙතිතේ තාල රූපයකි.
   3. තුන් තිතේ තාල රූපයකි.   4. සිව් තිතේ තාල රූපයකි.

16. ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම තුළින්
   1. පෞරුෂත්ව වර්ධනය සිදුවේ.   2. ශරීර සෞඛ්‍ය පිරිහීම සිදුවේ.
   3. මනස දුර්වල වීම සිදුවේ.   4. සිරුර අප්‍රාණික වීම ඇතිවේ.

17. සිතුවම් හා මූර්ති අයත්වන මූලාශ්‍ර වන්නේ,
   1. දේශාටන වාර්තාය.   2. රූකම් හා කැටයම්ය.
   3. සාහිත්‍ය කෘතීන්ය.   4. සෙල් ලිපිය.

18. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන දෙවි කෙනෙකු නොවන්නේ,
   1. කොහොඹාදෙවියන් ය.   2. නාථ දෙවියන්ය.
   3. ඉරුගල් බණ්ඩාර දෙවියන්ය.   4. කන්දේබණ්ඩාර දෙවියන්ය.

19. ගත්ත තෙහිගු තකට තකුද ... මෙය
   1. තුරඟා වන්නමේ කස්තිරමයි.   2. වෛරොඩි වන්නමේ තස්තිරමයි.
   3. වෛරොඩි වන්නමේ අඩව්වයි.   4. තුරඟා වන්නමේ අඩව්වයි.

20. පොකුරු බෙරය නමින් හඳුන්වනු ලබන්නේ
   1. ගැට බෙරයයි.   2. මිහිඟු බෙරයයි.   3. පහතරට බෙරයයි.   4. තම්මැට්ටමයි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

www.agaram.lk

# II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
  **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැට බෙරයයි.

i. උඩරට බෙරය ගැට බෙරය නමින් හැඳින්වීමට හේතුව කුමක්ද?

ii. උඩරට බෙරයේ බෙර කඳ සකස් කිරීමට යොදා ගන්නා අරටු සහිත දැව වර්ග 2 ක් හා එහි දකුණු හා වම් ඇස සඳහා යොදා ගන්නා නම් වර්ග 02 ක් නම් කරන්න.

iii. පංච තූර්ය වර්ගීකරණය අනුව ගැට බෙරය අයත් වන්නේ කුමන ගනයට ද?

iv. ගැට බෙරය වාදනය කරන ආගමික හා සාමාජීය අවස්ථා 2 ක් ලියන්න.

v. ගැට බෙරයේ රූප සටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න. (ල. 2x 5 = 10 )

(02) i. ස්වස්ථතාව කෙරෙහි බලපාන මූලික සාධක දෙක ලියන්න. (ල. 03)

ii. ඉහත සඳහන් කල සාධක දෙකෙන් ඔබ කැමති සාධකයක් පිළිබඳ කෙටියෙන් විස්තරයක් කරන්න. (ල. 04)

iii. මනස නිරෝගීව තබා ගැනීම සඳහා බලපාන කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(03) i. සිංහරාජ වන්නමෙන් කියවෙන අදහස ලියන්න. (ල. 05)

ii. කඩතුරා කවියක් ලියන්න. (ල. 05)

(04) i. එකොළොස්වන පා සරඹයේ සරඹ නාමය සහ හමාර පදය ලියන්න. (ල. 05)

ii. අට වන ගොඩ සරඹයේ සරඹ නාමය ලියා කස්තිරම ලියන්න. (ල. 05)

(05) i. නර්තන නිර්මාණයට සුදුසු ඔබ කැමති මිනිස් චරිත තුනක් ලියන්න. (ල. 05)

ii. ඉන් එක් චරිතයකට අදාළව සිද්ධියක් ගොඩනගන ආකාරය පියවරෙන් පියවර ලියන්න. (ල. 05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk